

# පළිබෝධ නාශක ආරක්ෂාකාරීව පරිහරණය කිරීම

**එච්. ඊ. සේනානායක,**
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ,
පැළෑටි සංරක්ෂණ සේවය, ගන්නොරුව.

ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව පළිබෝධ නාශක වලින් ඇතිවිය හැකි අන්තරාදායක තත්වයන් පිළිබඳව මනා දැනීමක් නොමැතිව අපරික්ෂාකාරීව මෙම ද්‍රව්‍යයන් පරිහරණය කිරීමෙන් හදිසි අනතුරු වලට භාජනයවන අවස්ථාවන් අධිකය.

තවද ඉතා අන්තරාදායක පළිබෝධ නාශක බෝගවලට යොදා නියමිත කාලසීමාව ඉක්මයාමට ප්‍රථම අලෙවිය සඳහා හොඳ මිලක් ලැබුන විගස අස්වැන්න රැස්කර වෙළඳ පොළට යැවීමටද ගොවීහු බොහෝ දෙනෙක් පුරුදුවී සිටිති. මෙයින් මුළු ලංකා වාසීන්ටම විෂ ද්‍රව්‍යයන් අනුභව කිරීම සඳහා බෝග බෙදහරිනවා පමණක් නොව මෙම බෝගවල නරක්වූ කොටස් වෙළඳ පොලේ භූමියේ දැමීම හේතුකොට ගෙන පරිසරයද දූෂණය කරනු ලැබේ.

පළිබෝධ නාශක වැඩි කොටසක් සකසා ඇත්තේ යම් දෙයක් විනාශකිරීම සඳහාය. උදා: කෘමීන්, මයිටයන්, දිලීර, වල්පැළෑටි, මීයන් හෝ වෙනත් පළිබෝධකයන්ය. නමුත්. පළිබෝධ නාශක සුරක්ෂිතව පරිහරණය කරනු ලබන්නේ නම් ඒවායින් ඇතිවිය හැකි අන්තරාය බොහෝ දුරට අඩුකර ගැනීමට පුළුවන. පළිබෝධ නාශක පිළිබඳව මනා දැනීමක් ඇති පුද්ගලයින් කිසි විටෙක අනතුරකට භාජනය නොවන අතර ඔහු පරිසරය දූෂණය නොකරයි.

පළිබෝධ නාශකයක් පරිහරණය කිරීමට ප්‍රථම මූලික වශයෙන් අප දැනගත යුතු වැදගත් සාධකයක් නම් පළිබෝධ නාශක ද්‍රව්‍ය තෝරා ගැනීමය.

**පළිබෝධ නාශක තෝරාගැනීම:**

බෝගයට කෘමිහානියක් හෝ රෝගයක් වැළඳුන විට ඊට සරිලන කෘෂි රසායනික ද්‍රව්‍ය තෝරා ගැනීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමට පුළුවන. යම්කිසි අයෙක් කෘෂි රසායනික ද්‍රව්‍යයක් මිළයට ගත්තැන් පටන් ඔහු මිළදීගත් ද්‍රව්‍යයේ අඩංගු දෑ පිළිබඳවද, ඒවා මිශ්‍ර කිරීමේ පිළිවෙල හා භාවිතය ආදී කරුණු පිළිබඳවද ඔහුට දැනීමක් නොතිබුනහොත් ඔහුට එම ද්‍රව්‍යයන්ගෙන් අන්තරා සිදුවීමට පුළුවන.

පළිබෝධ නාශක ද්‍රව්‍යයක් මිළයට ගැනීමට ප්‍රථම කෘමි හානිය පිළිබඳව ඇති ගැටළුව හඳුනා ගත යුතුය. තවද බෝගයට ආර්ථිකව හානියක් පැමිණෙන අවධියක් ඇතිවුවහොත් පමණක් කෘමිනාශකය යෙදීමට කටයුතු කළයුතුය. බෝගයට හානි කරන කෘමියා නිසි ආකාරයට හඳුනාගත් පසු අන්තරාදයක තත්වයන්ගෙන් අඩු, කෘමීන් ඉතා පහසුවෙන් මර්ධනය වන, අන් ජීවීන්ට අහිතකර නොවන කෘමිනාශකයක් තෝරා ගතයුතුය. මෙසේ තෝරාගන්නා කෘමිනාශකය අනිවාර්යයෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කර ලියාපදිංචි කළ කෘමි නාශකයක් වීම ඉතාම වැදගත්ය.

කෘමි නාශකය මිළදී ගැනීමට ප්‍රථම එය කොතරම් ප්‍රමාණයක් අවශ්‍ය වේද යන්න තීරණය කළ යුතුය. වැඩයට අවශ්‍ය ප්‍රමාණය පමණක් මිළයට ගන්න. එසේ නොකළහොත් ඉතිරිවන කෘමි නාශක නරක්වී යාමට පුළුවන. එසේ නොමැතිනම් ඉතිරි ඒවා විනාශ කිරීමේදී ගැටළු ඇතිවීමට පුළුවන. කුඩා කෘමි නාශක ඇසුරුම් කට්ටල් පරිහරණය කිරීම පහසුය. අත්වල තැවරීම හා අපතේ යාම අඩුකර ගැනීමට පුළුවන.

**පළිබෝධ නාශක ද්‍රව්‍ය මිශ්‍ර කිරීම හා භාවිතා කිරීම:**

පළිබෝධ නාශක ද්‍රව්‍යයන් මිශ්‍ර කිරීමේදී හා භාවිතා කිරීමේදී පහත දැක්වෙන දස පනත අනුගමනය කළයුතුය.

1. භාවිතා කිරීම සඳහා මිළයට ගත් පළිබෝධ නාශක ද්‍රව්‍යයේ අලවා ඇති කඩදාසි කැබැල්ලේ හෝ පළිබෝධ නාශක ද්‍රව්‍යයේ තොරතුරු ලියා ඇති කඩදාසිය පළමුව හොඳින් කියවා තේරුම් ගන්න.

2. පළිබෝධ නාශක ද්‍රව්‍ය යෙදීම සඳහා නිසි ආකාර උපකරණ සකස්කර ගන්න. උදා: හොඳින් ක්‍රියා කරන යන්ත්‍ර. ආරක්ෂිත ඇඳුම් කට්ටල, ප්‍රථමාධාර කට්ටලයක්.

3. අධික විෂ ද්‍රව්‍යයන්ගෙන් යුක්තවූ පළිබෝධ නාශක ද්‍රව්‍ය භාවිතා කිරීමේදී තනිවම ඒවා පරිහරණය නොකරන්න.

4. පළිබෝධ නාශක ද්‍රව්‍ය මිශ්‍ර කිරීමේදී හොඳින් වාතාශ්‍රය ඇති ස්ථානයක් තෝරාගන්න. ගෙයක් ඇතුළත කෘෂි රසායනික ද්‍රව්‍යයක් මොනම හේතුවක් නිසාවත් මිශ්‍ර නොකරන්න.

5. පළිබෝධ නාශක ද්‍රව්‍ය අඩංගු භාජනය අරින විට අත් වැස්මක් පළඳින්න. මුහුණේ හෝ ශරීරයේ විෂ ද්‍රව්‍ය නොතැවරෙන පරිදි ඒවා විවෘත කළයුතුය. තවද කෘමි නාශකය විසිරී යාමට ඉඩ නොතබන්න. කුඩු වශයෙන් ඇසුරා ඇති කෘමිනාශක කට්ටල කුමන හේතුවක් නිසාවත් අතින් ඉරා විවෘත කිරීමට තැත් නොකර, පිහියක් මගින් ඉතා පරික්ෂාකාරිව කපා විවෘත කිරීම යෝග්‍යය. මෙයට ප්‍රධාන හේතුව නම් අතින් ඉරා විවෘත කිරීමේදී කට්ටලයේ අඩංගු කුඩු ඉතා පහසුවෙන් විසිරී යාමට ඉඩ ඇති හෙයිනි.

6. පළිබෝධ නාශක මිශ්‍ර කිරීමේදී ක්‍රියාකාරී ද්‍රව්‍ය නියමිත ප්‍රමාණයට මැනගත යුතුය. සෑම අවස්ථාවකදීම මැනීම සඳහා භාවිතා කළ උපකරණය සෝදා පවිත්‍ර කළයුතුය.

7. පළිබෝධ නාශකය විසිරී ගියහොත් වහාම එම ස්ථානය පිරිසිදු කරන්න. ශරීරයේ සමෙහි තැවරුනහොත් වහාම සබන් දමා සෝදා ගන්න. ඇඳුම්වල තැවරුනහොත් ඇඳුම් කට්ටලය ඉක්මනින් මාරුකර ගන්න. පළිබෝධ නාශක තැවරුන ඇඳුම් පිරිසිදු ඇඳුම් සමඟ එකට නොතබන්න. අපිරිසිදු ඇඳුම් කට්ටලය නැවත භාවිතා කිරීමට ප්‍රථම හොඳින් සෝදා පවිත්‍ර කර ගන්න.

8. යම්කිසිවෙක් පළිබෝධ නාශක මිශ්‍ර කරන අවස්ථාවේ හෝ ඒවා පරිහරණය කරන අවස්ථාවේ හෝ ආහාර ගැනීමෙන්, දුම් පානයෙන් හෝ තේ වැනි දේ පානයෙන් තොරව සිටිය යුතුය. පළිබෝධ නාශක ඉසීම අවසාන වූවාට පසු හොඳින් ස්නානය කර පිරිසිදුවී, ආහාර ආදිය ගැනීමට තරයේ මතක තබාගත යුතුය.

9. කුඩා බෝතල් වලින් පළිබෝධ නාශක ගැනීමට බෝතලයට බට දමා කටින් ඉරීම නොකරන්න. පළිබෝධ නාශක මූඩි කටින් ඇරීමට කිසි විටෙක තැත් නොකරන්න. බෙහෙත් ඉසින යන්ත්‍රයේ නොසලය කටින් පිඹ පිරිසිදු නොකරන්න.

10. පළිබෝධ නාශකය ඉසීම සඳහා භාවිතා කරන බෙහෙත් ඉසිනය පුරවන අවස්ථාවේදී ඉසිනයේ බෙහෙත්, පිට කරන නොසලය උස් මට්ටමකින් තබා ගැනීමට අමතක නොකරන්න.

**පළිබෝධ නාශක ඉසීම:**

නිතර නිතර භාවිතා කරන පුරුදු පළිබෝධ නාශකයක් වුවද පිළිපැදිය යුතු කරුණු අමතක වීමට පුළුවන. මේ නිසා සුරක්ෂිත භාවය රැක ගැනීමට මිශ්‍ර කරගත් පළිබෝධ නාශක ඉසීමට ප්‍රථම නැවත වරක් ලේබලය කියවා බලන්න. ආරක්ෂිත ඇඳුම් පැළඳීමට උපදෙස් දී ඇත්නම් කෙතරම් අසහනකාරී වුවද ඒවා පිළිපැදිය යුතුය. තවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කර ඇති ප්‍රමාණය හෝ ලේබලයේ දක්වා ඇති ප්‍රමාණයට වඩා වැඩියෙන් හෝ අඩුවෙන් නොයොදන්න.

පළිබෝධ නාශකයක් ඉසීමට ප්‍රථම බෙහෙත් ඉසින යන්ත්‍රය පිරිසිදු විය යුතුය. එය හොඳින් ක්‍රියා කළ යුතුය. බෙහෙත් පිට කරන නොසලය අපිරිසිදු ද්‍රව්‍යයන්ගෙන් තොරව තිබිය යුතුය. ක්‍රමානුකූලව ක්‍රියා නොකරන ස්ප්‍රේ යන්ත්‍ර භාවිතා කිරීමෙන් බෙහෙත් ඉසින්නාටද, පරිසරයටද, බෝගයටද හානි සිදුවීමට ඉඩ ඇත.


තවද මෙවැනි යන්ත්‍ර භාවිතා කිරීමෙන් විටින් විට යන්ත්‍රය ක්‍රියා විරහිත වීමෙන් එය යථා තත්වයට ගෙන ඒමට ප්‍රයත්න දරන අවස්ථාවලදී තමන්ගේ කාලය අපතේ යනවා පමණක් නොව බෙහෙත් ශරීරයේ තැවරීමෙන් භයානක අනතුරු වලට භාජනය වීමට ඉඩ ඇත. අපද්‍රව්‍යයන්ගෙන් බට හා නොසලය හිරවී ගිය කල, කිසිවිටෙක කට තියා පිඹීමෙන් පිරිසිදු නොකරන්න.

එදිනෙද ආහාරයට ගන්නා බෝගවලට හා අනිකුත් බෝගවලට බෙහෙත් ඉසින ප්‍රමාණය හා ඒවායේ අස්වැන්න රැස්කර ගතයුතු කාලසීමාව ලේබලයේ දක්වා ඇත. මේ අනුව බෙහෙත් ඉසීමෙන් පසු නියමිත දින ගණන් යාමට ප්‍රථම බෝගයේ අස්වැන්න නෙලා නොගත යුතුය.

තවද බෙහෙත් ඉසින අවස්ථාවේදී අවට ඇති වෙනත් බෝග වලටද, මාළු ඇති කරන පොකුණු වලටද, ජල වාරිමාර්ග වලටද, ළිං වලටද, වැව් ආදී ස්ථාන වලටද, සතුන් ඇති කරන ස්ථානවලටද බෙහෙත් විසිරී නොයන අන්දමින් බෙහෙත් ඉසීම ඉතා වැදගත් සාධක වේ.

බෙහෙත් ඉසින අවස්ථාවේදී සුළඟ ඇත්නම් ඉසින්නාගේ මුහුණට පළිබෝධ නාශක මිශ්‍රණය වැදීමට ඉඩ ඇති හෙයින් සුළං හමන දිසාවට හරස්ව ඉසීම කළ යුතුය.

පහත සඳහන් රූප සටහන පරිදි බෙහෙත් ඉසීම කරන්න.




පටන් ගැන්ම

අවසානය

පළිබෝධ නාශක ඉසීම අවසාන වූවාට පසු බෙහෙත් ඉසීම සඳහා භාවිතා කරන උපකරණ මනුෂ්‍යයන් හා සත්වයින් ජලය පරිහරණය කරන ස්ථානවලින් සේදීම නොකරන්න. බෙහෙත් ඉසීම කළ තැනැත්තා හොඳින් ස්නානය කර අපිරිසිදු ඇඳුම් සෝද පිරිසිදු ඇඳුම් කට්ටලයක් ඇඳ ගත යුතුය.

පළිබෝධ නාශක ඉසින අවස්ථාවේදී කිසිවෙකු හට අසනීප ගතියක් හෝ ශරීරයේ යම්කිසි වෙනස්වීමේ ලක්ෂණ ඇති වුවහොත් වහාම බෙහෙත් ඉසීම නවතා වෛද්‍යවරයෙකු වෙත කැටුව යා යුතුය. මෙවැනි ලක්ෂණ ඇති අයෙක් වෛද්‍යවරයෙක් වෙත කැඳවාගෙන යන අවස්ථාවේදී භාවිතා කරන ලද පළිබෝධ නාශකයේ අලවා ඇති ලේබලයත් සමඟ එම බෝතලය රැගෙන යාමට අමතක නොකරන්න. බෝතලයේ ලේබලයේ, ඔහුට දියයුතු බෙහෙත් සඳහන්කර ඇත.

ඔබ පළිබෝධ නාශක භාවිතා කරන විට ඉහත සඳහන් කරුණු පිළිපැදීමෙන් හදිසි අනතුරු බොහෝ දුරට වළක්වා ගැනීමට පුළුවන.